# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2197/3 - 2020 ඔක්තෝබර් මස 12 වැනි සඳුදා - 2020.10.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් මෙහි උපලේඛනයෙහි I, II හා III වන තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2020 අගෝස්තු මස 21 දිනැති අංක 2189/47 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් සංශෝධිත, 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා, මෙහි උපලේඛනයෙහි IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2020 ඔක්තෝබර් මස 13 දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 5204 — 525 (2020/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | විස්තරය<br>III | නිෂ්පාදන බද්ද<br>IV |
|---|---|---|---|
| **22.02** | | **සීනි හෝ අනෙකුත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවන ලද (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග හා ශීර්ෂ 20.09හි සඳහන් පළතුරු හෝ එළවළු යුෂ අඩංගු නොවූ අනෙකුත් අමද්‍යපාන වර්ග** | |
| | 2202.10 | සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රසකළා වූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | ලීටරයකට රු. 12ක් හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර් 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | 2202.99 | අනෙකුත් | |
| | 2202.99.30 | "ශක්ති ජනක පාන" ලෙස අලෙවි වන පාන වර්ග | ලීටරයකට රු. 12ක් හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර් 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- යන දෙකෙන් වැඩි අගය |
| | | පළතුරු හෝ එළවළු යුෂ පාදක කරගත් පානයන් : | |
| | 2209.99.51 | මිලි ලීටර් 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6කට වඩා වැඩි පානයන් | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර් 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- |
| | | අනෙකුත් : | |
| | 2202.99.91 | මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6කට වඩා වැඩි පානයන් | නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර් 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30/- |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.